## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

## කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි කැඳවීම

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය දේශීය නිශ්පාදකයන් වෙතින් සියළුම වෛද්‍ය සැපයුම් ලෙස ගැනෙන ඖෂධ, ශල්‍ය පාරිභෝජ්‍ය, ශල්‍ය උපකරණ, ශල්‍ය සැරහුම් හා රසායනාගාර සඳහා අදාල රසායනික ද්‍රව්‍ය, ප්‍රතිකාරක, පරීක්ෂක කට්ටල, විදුරු උපකරණ, ලෝහ උපකරණ, ප්ලාස්ටික් උපකරණ යනාදිය සම්පාදනය සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි මෙයින් කැඳවනු ලැබේ.

**1. හැඳින්වීම**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මෙරටේ රාජ්‍ය අංශ රෝහල් සඳහා අවශ්‍ය ඉහත සඳහන් වෛද්‍ය සැපයුම් අඛන්ඩව හා ගුනාත්මක ලෙස රෝහල් වෙත සම්පාදනය උදෙසා හා රටේ ආර්ථිකය ශක්තිමත් කර ගැනිමේ අරමුණු පෙරදැරි කොට දේශීය නිෂ්පාදකයන් ගෙන් ගිවිසුම් යටතේ මිලදී ගැනිමට තිරණය කර ඇත.

දේශීය නිශ්පාදකයා නිර්නය කිරිම පහත පරිදිවේ

i. නිශ්පාදන ආයතනය ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ සංස්ථාපිත වී තිබීම හෝ සමාගම් නාම ලියා පදිංචි කිරීමේ ආඥා පනත යටතේ ආයතනගත කර තිබීම
ii. අවම වශයෙන් ආයතන කොටස් 51% ට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලාංකිකයින් සතුව තිබීම
iii. අධ්‍යක්ෂක මණ්ඩලය, තුනෙන් දෙකකට වැඩි කොටසක් ශ්‍රී ලාංකිකයින්ගෙන් සමන්විත වීම
iv. සේවක සංඛ්‍යාව 80% වැඩි ප්‍රමාණයකින් ශ්‍රී ලාංකිකයින්ගෙන් සමන්විත වීම
v. කෙසේ වුවද ආයතනය අවුරුදු 20 කට වැඩි කාලයක් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන්නේ නම් ඉහත ii, iii, හා iv දක්වන ලද කරුණු සපුරා නැති වුවද එම ආයතන බලාපොරොත්තුවන කාර්යය සඳහා සුදුසු සේ සලකනු ලබයි
vi. දේශීය නිශ්පාදිත ඖෂධ යනුවෙන් අදහස් කරනු ලබන්නේ ක්‍රියාකාරී ඖෂධයන්හි ඇතුලත් ද්‍රව්‍ය පූර්වගය ද්‍රව්‍යා භාවිතයෙන් නිශ්පාදනය කිරිම වේ
vii. ඇසුරුම් කිරිම, නැවත ලේබල් කිරිම සහ තනුක කරණය කිරිම දේශීය නිෂ්පාදනය ලෙස සලකනු නොලැබේ
(පිරිවිතර සහිත වෛද්‍ය සැපයුම් ලැයිස්තුව හා ඒවායේ වාර්ශික අවශ්‍ය ප්‍රමාණයන් වෛද්‍ය සැපයුම් අංශයේ www.msd.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැකි වේ)

සුදුසුකම් ලබා ඇති නිශ්පාදකයන් විසින් පහත සඳහන් තොරතුරු අඩංගු යෝජනා 'අතිරේක ලේකම් (ප්‍රසම්පාදන), සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10' වෙත මුද්‍රා තබන ලද කවරයක බහා ගෙනවිත් භාරදිම හෝ ලියාපදිංචි තැපෑලෙන් ඉහත දක්වා ඇති ලිපිනයට 2015.10.15 දින පෙ.ව.10.30 ට පෙර ලැබෙනසේ එවිය යුතු වේ. කවරයේ වම්පස උඩ කෙලවරේ "වෛද්‍ය සැපයුම් සම්පාදනයට කැමැත්ත ප්‍රකාශ කිරිම" යනුවෙන් සඳහන් කළ යුතුය

**2. ඉදිරිපත් කලයුතු පොදු කරුණු**

i. ආයතනය/සමාගම පිළිබඳ විස්තර
ii. ඉහත සඳහන් වෛද්‍ය සැපයුම් නිශ්පාදනය සම්බන්ධයෙන් ලබාගෙන ඇති කළමනාකරණ පලපුරුද්ද
iii. කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර හා ඔවුන්ගේ තාක්ෂණික සුදුසුකම්
iv. යෝජිත වෛද්‍ය සැපයුම් නිශ්පාදනයන්හි විස්තරාත්මක තොරතුරු හා ඒවායේ පිරිවිතර

**3. මූල්‍ය තොරතුරු**

i. නිශ්පාදනය කරන ලද ඒකකයක මිල හා වලංගු කාලය
ii. එක් එක් අයිතමයන්ගේ වාර්ශික නිශ්පාදන ධාරිතාවය
iii. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය
iv. ලියාපදිංචි සමාගමක් වන්නේ නම් සංගමයේ වගන්ති අඩංගු (Articles of Association) ප්‍රකාශනය
v. ආසන්නම පෝරම 20 සහ පෝරම 01
vi. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් නිකුත්නරණ ලද යහ නිශ්පාදන භාවිතය (GMP)සඳහා වූ වලංගු සහතිකය
vii. පසුගිය ආසන්න අවුරුදු තුන සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ගිණුම් ප්‍රකාශන
viii. භූමි භාගය පිහිටි සිතියම හා එහි විටි මාර්ග
ix. ආසන්න පසුගිය වර්ශ තුන සඳහා ආයතනයට අදාල නඩු හබ යනාදිය ඇත්නම් ඒවායේ විස්තර
x. වෛද්‍ය සැපයුම් සම්පාදනය කිරීමෙහි ලබා ඇති පළපුරුද්ද
xi. ගිවිසුම් වටිනාකම රුපියල් මිලියන දහයකට වැඩි වන්නේ නම් 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත්තු පනත යටතේ ලියා පදිංචිය
xii. ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන ප්‍රභවය (මූලාශ්‍රය) සහ මූල්‍ය ක්‍රමවේදය ඇතුළු කොන්දේසි හා නියමයන්
xiii. ව්‍යාපාරික ගිණුම් වාර්තා පිළිබඳ විස්තර
xiv. පිළිවෙලින් පසුගිය අවුරුදු තුනක (2012, 2013 සහ 2014) ව්‍යාපාරයේ සමස්ථ පිරිවැටුම ඇතුළු විඝණනය කරන ලද මූල්‍ය වාර්තා
xv. අරමුදල් සපයාගනු ලබන්නේ ණය මුදලකින් නම් ඒ පිළිබඳ විස්තර
xvi. හිඟ හා අනපේක්ෂිත බැඳීම් පිළිබඳ පසුගිය වසර තුනෙහි විස්තර
xvii. අදාල වෛද්‍ය සැපයුම් සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියෙහි (NMRA) ලියාපදිංචිය අවශ්‍ය වන්නේ නම් එහි ලියාපදිංචිය
xviii. නව නිශ්පාදකයකු වන්නේ නම් ඔහුගේ මූල්‍යමය හා තාක්‍ෂණික හැකියාවන් ඔප්පු කල යුතු වේ

4. බලාපොරොත්තු වන්නාවූ කාර්යය සඳහා සුදුසුකම්ලත් නිශ්පාදකයන් තාක්‍ෂණ ඇගයීම් කමිටුව වෙත කැඳවා සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යංශයට අවශ්‍ය වන්නාවූ වෛද්‍ය සැපයුම් සම්පාදනය සඳහා එම සුදුසුකම් ලත් නිශ්පාදකයින්ගේ නිශ්පාදන ධාරිතාවයන් සැළකිල්ලට ගෙන කොටස් වශයෙන් බෙදා දෙනු ලැබේ.

5. තෝරාගත් නිශ්පාදකයන්, සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යංශය සමග ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුම (Buy Back Agreement) ගිවිසුම්ගත වීමට එකග විය යුතු අතර ගිවිසුම් කාලය සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යංශය විසින් තීරණය කරණු ලබයි.

6. ඉදිරිපත් කරනු ලබන යෝජනාව පුවත්පත් නිවේදනයේ ඉල්ලා ඇති සියළුම විස්තර වලින් සම්පූර්න විය යුතු අතර එසේ නොවන්නේ නම් යෝජනාව ප්‍රතික්ෂේප කිරීමට ඉඩකඩ ඇත.

7. දැනටමත් ඖෂධ දේශිය නිශ්පාදකයන් වෙතින් දිර්ඝ කාලින ගිවිසුම් යටතේ ප්‍රසම්පාදනයට කටයුතු සලස්වා ඇති නිශ්පාදකයන් වෙත මෙම කැඳවුම අදාල නොවන්නේය.

**ලේකම්**
සෞඛ්‍ය, පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යංශය
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.
දුරකථන හා ෆැක්ස් - 011 2672883